# 4 ශ්‍රේණිය

# පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

# මිනිසා හා තොරතුරු






සැකසුම :- එම්.එම්.කේ. එස් කුමාරි

**සන්නිවේදනය යනු අදහස්, තොරතුරු හා ආකල්ප එක් පුද්ගලයෙකුගෙන් තවත් පුද්ගලයෙකුට යැවීම වේ**

**එනම් වාචිකව හෝ අවාචිකව තොරතුරු අදහස් හා විස්තර ආදී එකිනෙකා අතර හුවමාරු කර ගැනීමයි.**

- මිනිසා සන්නිවේදන සත්ත්වයෙකු මෙන්ම සමාජීය සත්ත්වයෙක් එබැවින් ඔවුන් සමූහයක් ලෙස ජීවත්වීම ප්‍රිය කරයි එමෙන් ම හුදකලාව ජීවත් වීමට ප්‍රියනොකරයි. සමූහයක් ලෙස ජීවත්වීමේදී සමූහයේ සාමාජිකයන් අතර ද සමූහ අතර ද සන්නිවේදනය කිරීමේ යම් ක්‍රමයක් අවශ්‍යවේ. ඒ නිසාවෙන් ම සන්නිවේදන ක්‍රම බිහි විය.

**අතීතයේ ජීවත් වූ මිනිසා භාවිත කළ සන්නිවේදන ක්‍රම**



- අංග චලන /කතාබහ/ කටින් කට
- අණබෙර වැයීම
- ගිනිගොඩක් ගැසීම
- හූ කීම
- කොඩි එසවීම
- සතුන් මගින් (අශ්වාරෝහක, පරවි, හංස වැනි පක්ෂීන් මගින්
- ඝණ්ටාව නාද කිරීමෙන්

එම්.එම්.කේ.එස් කුමාරි

**මුහුණේ ඉරියව් මගින් ප්‍රකාශ කරන හැඟීම්**



- සතුට
- බය
- ශාන්ත ගතිය
- පිළිකුල
- ශෝකය
- තරහ
- වීරත්වය

**සන්නිවේදනයේ අංග**

- යවන්නා
- මාධ්‍ය
- ලබන්නා

උදාහරණය

| | | |
|---|---|---|
| **යවන්නා** → | **මාධ්‍ය** → | **ලබන්නා** |
| **ලියුම ලියන්නා** → | **ලියුම** → | **ලියුම ලබන්නා** |

**ලියුමක් ලිවීමේ සිට ලබන්නා දක්වා සිදුවන පියවර පහත සටහන මගින් අවබෝධ කරන්න.**

ලියුමක් ලිවීම → තැපැල් කන්තෝරුවට යාම → මුද්දර මිල දී ගැනීම → ලිපි කවරය තුළ ලියුම බහාලීම, මුද්දර ඇලවීම → කවරයේ යැවිය යුතු ලිපි යොමුව ලිවීම → තැපැල් පෙට්ටිය තුළට දැමීම → ලියුම්කරු එම ලිපි තැපැල් කන්තෝරුවට ගෙන යාම → ලියුම් බෙදන්නා එම ලියුම් තෝරා, අදාළ ලිපි යොමුවට/නිවෙස්වලට බෙදා හැරීම

**සංයමයෙන් හා අන්මත ඉවසීමෙන් යුතුව තම අදහස් ප්‍රකාශ කිරීමේ වැදගත්කම**

බොහෝ කාලයකට පසු හමු වූ මිතුරකු යැයි සිතා දෙදෙනාට ම එක වර තමන්ගේ යහළුවාට කීමට ඇති දේ පැවසීට යොමු කිරීම

උදාහරණ : - තමන්ගිය චාරිකාවක විස්තර උපන්දින උත්සවක දා සිදුවීමක්, වෙනත් සිද්ධියක් පිළිබඳව කතා කිරීමට යොමු කිරීම.

එම්.එම්.කේ.එස් කුමාරි

**මෙම ක්‍රියාකාරකම මගින් තහවුරු කර ගත් කරුණු වූයේ,**

- දෙනොම එකවර කතා කරන බැවින් කිසිවක් ඒ දෙනොටම නොතේරීම.
- ඒ නිසා මනා සන්නිවේදනයක් සඳහා ඉවසීමෙන් තම අදහස් ප්‍රකාශ කළ යුතුයි.

**නූතන සන්නිවේදන ක්‍රම**

- රූපවාහිනිය
- ගුවන් විදුලිය
- පුවත්පත්
- සඟරා
- ස්ථාවර දුරකථනය
- ජංගම දුරකථනය
- පරිගණකය / අන්තර්ජාලය
- කෙටි පණිවුඩ
- විද්‍යුත් තැපැල
- ෆැක්ස්




පුවත්පත්



පොස්ටර්



දැන්වීම්



ගුවන් විදුලිය



දුරකථනය



ලිපි



රූපවාහිනිය



සඟරා



ජංගම දුරකථනය



ඊ මේල්

එම්.එම්.කේ.එස් කුමාරි

**මිනිසුන් තොරතුරු ලබා ගන්නා ක්‍රම**

- ❖ රූපවාහිනිය
- ❖ ගුවන් විදුලිය
- ❖ පුවත්පත්
- ❖ පරිගණකය / අන්තර්ජාලය
- ❖ දුරකථනය
- ❖ පුස්තකාලය (පොත්පත් / පුවත්පත්)

**තොරතුරු ලබා ගන්නා ආකාර**

- ❖ ගුවන් විදුලිය - ප්‍රවෘත්ති කියවීම / ඉදිරිපත් කිරීම
- ❖ ගුවන් විදුලිය - පුවත්පත් වාර්තා ඉදිරිපත් කිරීම
- ❖ රූපවාහිනිය - ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීම
- ❖ රූපවාහිනිය - පුවත්පත් වාර්තා ඉදිරිපත් කිරීම

- ❖ රූපවාහිනිය - ප්‍රවෘත්ති
  - → ක්‍රීඩා
  - → වෛද්‍ය
  - → ඉවුම් පිහුම්
  - → විනෝද ජනක

  } පිළිබඳ වැඩසටහන්

❖ අතින් ගෙන යා හැකි දුරකථන භාවිත කරන අවස්ථා →
- යහළුවෝ
- වෛද්‍ය
- රාජකාරි කටයුතු
- දෙමව්පියෝ

❖ පරිගණකය / උකුළු පරිගණකය / TAB →
- ප්‍රවෘත්ති
- තොරතුරු (විද්‍යුත් තැපැල)
- පින්තූර (ඡායාරූප)
- වීඩියෝ දර්ශනය

**තොරතුරු හුවමාරු කර ගන්නා ක්‍රම ආකාර තුනකට වර්ග කළ හැකිය**

01. කන මුල් කරගෙන තොරතුරු ලබා ගැනීම (ශ්‍රව්‍ය මාධ්‍ය)

ගුවන් විදුලිය
දුරකථනය
ශබ්ද විකාශන යන්ත්‍රය

එම්.එම්.කේ.එස් කුමාරි




02. ඇස මුල් කරගෙන තොරතුරු ලබා ගැනීම (දෘශ්‍ය මාධ්‍ය)

| | |
|---|---|
| පුවත් පත | පොස්ටරය හ බැනර් |
| අත් පත්‍රිකා | දැන්වීම් |
| සඟරා | ලිපි |



03. ඇස හා කන මුල් කර ගෙන තොරතුරු ලබා ගැනීම (ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය)

රූපවාහිනිය

ජංගම දුරකථනය

අන්තර් ජාලය

ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය




**ක්ෂණික කෙටි දුරකථන අංක**

එම්.එම්.කේ.එස් කුමාරි

- 1919 - රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය
- 1231 - ටෙලිකොම් දුරකථන නාමාවලි තොරතුරු
- 1929 - ළමා උපකාරක දුරකථන සේවාව
- 1901 - විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය
- 1987 - ලංකා විදුලිබල මණ්ඩලය
- 1939 - ජල සම්පාදන මණ්ඩලය
- 1991 - පරිසර අමාත්‍යාංශය
- 1920 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
- 1954 - අල්ලස් හා දූෂණ අංශය
- 1912 - සංචාරක අමාත්‍යාංශය
- 1973 - ශ්‍රී ලංකන් එයා (ර්) ලයින්ස්
- 1933 - අනවසර ඉදිකිරීම් සම්බන්ධව
- 110 - ගිනි නිවීම් අංශය
- 118 - බෝම්බ නිෂ්ක්‍රිය අංශය
- 119 - හදිසි පැමිණිලි අංශය

**ක්‍රීඩාවක් කරමු**

- ❖ පන්තියේ සිසුන් සමාන කණ්ඩායම් දෙකකට බෙදෙන්න

- ❖ එක් කණ්ඩායමක් විශාල රවුමක් තුළත්, අනෙක් කණ්ඩායම තරමක කුඩා රවුමක් තුළ ද සිටුවා පිටත රවුමේ සිටින සිසුන්ට ඇතුළත රවුමෙන් යහළුවකු වෙන් කරන්න.
  (මෙම රවුම් දෙකෙහි සිටින ක්‍රීඩකයන් විරුද්ධ දෙසට ගමන් කළ යුතු යි. ක්‍රීඩකයන්ට ගමන් කිරීමට රවුම් දෙක අතර පරතරය මීටර 3ක් පමණ වන සේ සහ පිට රවුමේ විෂ්කම්භය මීටර 10ක් පමණ වේ.)

- ❖ ගුරුවරයාගේ පළමු සංඥාවට කණ්ඩායම් දෙක ම අඳින ලද රවුම තුළ විරුද්ධ දිශාවට ඇවිදීම.

- ❖ දෙවන සංඥාවට අනුව මැද රවුමේ සිටින අය පමණක් පිට රවුමේ සිටින තම යහළුවා වෙත දුවගොස් යහළුවා සොයා ඉක්මනින් බිම වාඩි වීම.

- ❖ ඉක්මනින් බිම වාඩි වූ දෙදෙනා ජයග්‍රහණය කරනු ඇත.

එම්.එම්.කේ.එස් කුමාරි